# ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

# ඇබෑර්තු

## ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, පහත දක්වා ඇති පුරප්පාඩු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් වෙතින් 2025.12.03 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුරු : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/II ශ්‍රේණිය, කථිකාචාර්ය (තහවුරු නොකළ) / කථිකාචාර්ය (පරිවාස), පුස්තකාලයාධිපති, වැඩ ඉංජිනේරු (සිවිල්) ක්‍රමලේඛක සහ පද්ධති විශ්ලේෂක II ශ්‍රේණිය, පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක II ශ්‍රේණිය.**

**සුදුසුකම් : වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව හි වෙබ් අඩවිය වන https://gwu.ac.k/ පරිශීලනය කරන්න.**

| අධ්‍යානාංශය | විශේෂීකරණය වූ ක්ෂේත්‍ර | වෙනත් කරුණු |
|---|---|---|
| **දේශීය වෛද්‍ය විද්‍යා පීඨය** | | |
| 1. ද්‍රව්‍ය ගුණ විඥාණ අධ්‍යයනාංශය | රස ශාස්ත්‍ර සහ භෛසජ්ජ්‍ය කල්පනා | ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධියක් සමග විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම තිබීම. |
| 2. කෞමාරභෘත්‍ය සහ ස්ත්‍රී රෝග අධ්‍යයනාංශය | ස්ත්‍රී රෝග සහ ප්‍රසූති තන්ත්‍ර (නාරිවේදය සහ ප්‍රසව විද්‍යාව) | ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධියක් සමග විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම තිබීම. |
| 3. ශල්‍ය ශාලක්‍ය අධ්‍යයනාංශය | ශාලක්‍ය තන්ත්‍ර, විශේෂයෙන් නේත්‍ර (ඇස) කර්ණ (කන) නාසා (නාසය) මුඛ (කට) සහ ශිර (හිස) ආබාධ කළමනාකරණය. | ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධියක් සමග විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම තිබීම. |
| 4. චිකිත්සා අධ්‍යයනාංශය | ස්වස්තවෘත්ත සහ යෝග විෂයෙහි විශේෂිත | ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධියක් සමග විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම තිබීම. |
| 5. රෝග විඥාන අධ්‍යයනාංශය | ක්ෂුද්‍ර ජීව විද්‍යාව/ වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යාව. | ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත විද්‍යාවේදී (විශේෂ/ ගෞරව) උපාධිය සහ වෛද්‍ය ක්ෂුද්‍ර ජීව විද්‍යාව පිළිබඳ විශේෂිත ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම තිබීම. (ශාස්ත්‍රපති / දර්ශනපති/ දර්ශනශූරි) |
| 6.දේශීය චිකිත්සා අධ්‍යයනාංශය | දේශීය චිකිත්සාව පිළිබඳ විශේෂඥ දැනුම, සාම්ප්‍රදායික වෛද්‍ය පරම්පරාවකට අයත් වීම වඩාත් සුදුසුය. | ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය සමග විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම තිබීම. |
| **දේශීය සෞඛ්‍ය විද්‍යා සහ තාක්ෂණ පීඨය** | | |
| **1. දේශීය වෛද්‍ය සම්පත් අධ්‍යයනාංශය** | ඖෂධ තාක්ෂණය/ ශාකසාර ඖෂධ/ ඖෂධවේදය සහ භෛෂජ්‍ය සංජානනය/ ඛනිජ අඩංගු ශාකසාර ඖෂධ සැකසීම. | අයදුම්කරුවන්හට ප්‍රථම හෝ දෙවන පංති (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත ෆාමසි හෝ ඖෂධවේදී (විශේෂ/ ගෞරව) උපාධිය හෝ ආයුර්වේද වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධියක් සමග විශේෂීකරණය වූ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම තිබීම.<br>විශේෂීකරණය වූ ක්ෂේත්‍රයන්ගෙන් මණ්ඩල සහතිකය සහිත වෛද්‍ය ශූරි (MD) හෝ දර්ශනශූරි (PhD) උපාධිය සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමිවේ. |

## පුස්තකාලය

**පුස්තකාලයාධිපති**

(1) (i) ප්‍රථම හෝ දෙවන පංතියේ (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත විශේෂී උපාධියක් හෝ

(ii) දෙවන පංතියේ (පහළ පෙළ) සාමාර්ථයක් සහිත විශේෂ උපාධියක් හෝ ප්‍රථම හෝ දෙවන පංතියෙ (ඉහළ පෙළ) සාමාර්ථයක් සහිත සාමාන්‍ය උපාධියක් හෝ

(iii) උපාධි විභාගයකින් සමත්වීම සහ පුස්තකාල සහ විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ නිබන්ධනයක් / පර්යේෂණ ග්‍රන්ථයක් මගින් වූ පර්යේෂණ සංරචකයක් සහිත, අවම වශයෙන් අධ්‍යයන වර්ෂ 02 ක කාලයක පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**සහ**

(2) නිබන්ධනයක්/ පර්යේෂණ ග්‍රන්ථයක් මගින් වූ පර්යේෂණ සංරචකයක් සහිත, අවම වශයෙන් අධ්‍යයන වර්ෂ 02 ක කාලයක පූර්ණකාලීන අධ්‍යයන පාඨමාලාවක් (හෝ සමාන අර්ධකාලීන අධ්‍යයන පාඨමාලාවක්) හැදෑරීමෙන් පසුව පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හෝ දර්ශනශූරි උපාධිය ලබා තිබීම.

**සහ**

(3) පුස්තකාල සහ විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රකාශන

(4) ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්ද හෝ ඉහත (2) හි සඳහන් සුදුසුකම් ලබාගැනීමෙන් පසු පහත එකෙහි හෝ දෙකෙහිම අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද

(i) පිළිගත් පුස්තකාලයක පුස්තකාලයාධිපති ධූරයේ

(ii) පුස්තකාල සහ විඥාපන විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදු කිරීමේ.

(5) පුස්තකාලයාධිපති තනතුර සඳහා වූ ලකුණුදීමේ පටිපාටියෙහි දක්වා ඇති අවම ලකුණු ප්‍රමාණය ලබා තිබීම.

සැ. යු. සහකාර පුස්තකාලයාධිපති තනතුර සඳහා පත් කිරීමේදී ඉහත (1) (iii) යටතේ පිළිගත් පශ්චාත් උපාධියක් සඳහා ඉහත (02) යටතේ පිළිගැනීමක් / ලකුණු ලබාදීමක් සිදු නොවේ. පුස්තකාල විද්‍යාවේදී දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය (ODL) මාර්ගගත ඉගෙනුම්/ ප්‍රවේශ උපායමාර්ග පිළිබඳ පළපුරුද්ද ODL - හා සම්බන්ධ අධ්‍යයන කටයුතු පිළිබඳ පළපුරුද්ද සහ පුස්තකාල ජාල කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද ඇති අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ.

**අයදුම් කිරීමේ ක්‍රමවේදය**

**බඳවා ගැනීම සඳහා වන අයදුම්පත් සමග පහත දෑ ඉදිරිපත් කළ යුතුය.**

(අ) අයදුම්කරුගේ ජීවදත්ත තොරතුරු (CV)

(ආ) පහත කරුණු සඳහා දක්වන ලද නිශ්චිත දයකත්වය දක්වමින් ඔහුගේ/ ඇයගේ සම්පූර්ණ වෘත්තීය ජීවිතය, පිළිබඳ ඇගයීමක්

- ➢ පුස්තකාලයාධිපති සහ අධ්‍යයන සංවර්ධනය
- ➢ පර්යේෂණ සහ නිර්මාණාත්මක කාර්යයන්
- ➢ දැනුම ව්‍යාප්ත කිරීම සහ විශ්වවිද්‍යාල සහ ජාතික සංවර්ධනයට දයකත්වය ලබාදීම.

(ඇ) අයදුම්කරුගේ ප්‍රකාශන, පර්යේෂණ, පත්‍රිකා සහ වෙනත් අදාළ ලිපිලේඛනයන් හි පිටපත් තුන බැගින් වෙනත් අදාළ ලිපිලේඛනයත් සහ කරුණු ඇගයීමට ලක්කළ හැකි ආකෘතියකින් පිටපත් තුනක් බැගින් ඉදිරිපත් කළ යුතුය.

(ඈ) අයදුම්කරුගේ කැපී පෙනෙන පර්යේෂණ පත්‍රිකා/ ප්‍රකාශන පහක (05) මාතෘකා

වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර UGC චක්‍රලේඛ අංක 921 සහ GWUIM වෙබ් අඩවිය https://gwu.ac.lk/ පරිශීලනය කරන්න.

## නඩත්තු අංශය

**වැඩ ඉංජිනේරු (සිවිල්) (II ශ්‍රේණිය)**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ උසස් අධ්‍යාපන ආයතනයකින් සිවිල් ඉංජිනේරු විද්‍යාව විෂය විශේෂිකරණය වූ ඉංජිනේරු විද්‍යාවේදී උපාධියක් ලබාතිබීම සහ ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ (ECSL) සහය ඉංජිනේරු (Assosiate Engineer) හෝ ඉහළ සාමාජිකත්වයක් ලබා තිබීම.

**හෝ**

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ උසස් අධ්‍යාපන ආයතනයකින් සිවිල් ඉංජිනේරු තාක්ෂණය විෂය හෝ ඉදිකිරීම් තාක්ෂණය විෂය විශේෂිකරණය වූ ඉංජිනේරු තාක්ෂණ ප්‍රථම උපාධියක් (BET) ලබාතිබීම සමග පිළිගත් ආයතනයක සිවිල් ඉංජිනේරු වැඩ පිළිබඳ අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද සහ ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ (ECSL) අනුබද්ධ ඉංජිනේරුවරයකු (Affiliate Engineer) ලෙස හෝ ඉහළ ලියාපදිංචියක් ලබා තිබීම.

**හෝ**

(ඇ) සිවිල් ඉංජිනේරු විද්‍යාව විශේෂිතකරණය වූ ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව ( NDT) හෝ සමාන සුදුසුකමක් සමග පිළිගත් ආයතනයක සිවිල් ඉංජිනේරු වැඩ පිළිබඳ අවම වශයෙන් වසර හතක (07) පළපුරුද්ද සහ ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ (ECSL) සංස්ථාපිත ඉංජිනේරුවරයකු ලෙස හෝ ඉහළ ලියාපදිංචියක් ලබා තිබීම.

සැ. යු. සේවාස්ථ පුහුණු කාලය සේවා පළපුරුද්දක් සේ සලකනු නොලැබේ.

## තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය / දේ. ස. වි.ක. අ. පීඨය /අධ්‍යයන ආයතනය

**ක්‍රමලේඛක සහ පද්ධති විශ්ලේෂක II ශ්‍රේණිය**

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රථම හෝ දෙවන පංතියේ සාමාර්ථයක් සහිත, පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම.

**හෝ**

(ii) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය සමත්වීම.

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රථම හෝ දෙවන පංතියේ සාමාර්ථයක් සහිත, පරිගණක විද්‍යාව විෂය සංරචකයක් වූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබාතිබීම.

**සහ**

(ආ) පරිගණක ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

**හෝ**

(iii) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව විෂය සංරචකයක් වූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමත්වී තිබීම.

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රථම හෝ දෙවන පංතියේ සාමාර්ථයක් සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් (පරිගණක විද්‍යාව විෂය සංරචකයක් නොවූ) සමත් වී තිබීම

**සමග**

(ආ) පරිගණක ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්ද

**හෝ**

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් (පරිගණක විද්‍යාව විෂය සංරචකයක් නොවූ) සමත් වීම.

**සහ**

පරිගණක ක්ෂේත්‍රයේ වසර තුනක පළපුරුද්ද

**හෝ**

(V) වෙනත් ඕනෑම උපාධියක් ලබාතිබීම.

**සහ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව/ පරිගණක තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**හෝ**

(vi) විශ්වවිද්‍යාල සේවයේ පරිගණක ක්‍රමලේඛකයකු ලෙස වසර 15 ක පළපුරුද්ද.

පහත ක්ෂේත්‍ර පිළිබඳ මනා දැනුමක් සහ පළපුරුද්දක් සහිත අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමිවේ.

- ➢ අධ්‍යාපන කළමනාකරණය සහ තොරතුරු පද්ධති සංවර්ධනය/ ක්‍රියාත්මක කිරීම/ උපදේශනය
- ➢ windows / Linux සේවා සහ උපස්ථ සේවා වින්‍යාස කිරීම, කළමනාකරණය සහ නඩත්තු කිරීම.
- ➢ දත්ත සමුදයන් නිර්මාණය කිරීම සහ කළමනාකරණය (MSSql, MySQL) සහ NET, PHP, HTML, CSS, Java ක්‍රමලේඛනය.
- ➢ C# Java Script, Oracle හෝ වෙනත් පරිගණක භාෂා පිටපත් රචනය.
- ➢ ජංගම යෙදවුම් සංවර්ධනය

**පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක II ශ්‍රේණිය**

(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රථම හෝ දෙවන පංතියේ සාමාර්ථයක් සහිත, පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම.

**හෝ**

(ii) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව/ පරිගණක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය සමත්වීම.

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රථම හෝ දෙවන පංතියේ සාමාර්ථයක් සහිත, පරිගණක විද්‍යාව විෂය සංරචකයක් වූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් ලබාතිබීම.

**සහ**

(ආ) පරිගණක ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද

**හෝ**

(iii) (අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව විෂය සංරචකයක් වූ විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් සමත්වී තිබීම.

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ප්‍රථම හෝ දෙවන පංතියේ සාමාර්ථයක් සහිත විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් (පරිගණක විද්‍යාව විෂය සංරචකයක් නොවූ) ලබා තිබීම

**සහ**

(ආ) පරිගණක ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්ද

**හෝ**

(iv) පිළිගත් විශ්වවිද්‍යාලයකින් විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් (පරිගණක විද්‍යාව විෂය සංරචකයක් නොවූ) සමත් වී තිබීම.

**සහ**

පරිගණක ක්ෂේත්‍රයේ වසර තුනක පළපුරුද්ද

**හෝ**

(V) වෙනත් ඕනෑම උපාධියක් ලබාතිබීම.

**සහ**

(vi) පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව/ පරිගණක තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

**සහ**

පරිගණක ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද.

## වැටුප් පරිමාණය

අ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, I ශ්‍රේණිය - රු.160, 520 - 7 X 3,3900 - 187, 820 (මාසික) [U-AC3(I)] අදාළ වැටුප් පරිමාණයේ රු.160,520/= (මාසික) මූලික පියවරෙහි පිහිටුවනු ලැබේ. අධ්‍යයන දීමනාව වැටුපෙන් 116% + රු. 2,200/ ක් ගෙවනු ලැබේ.

ආ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, II ශ්‍රේණිය = රු. 138,980 - 11X2,940 - 171,320 (මාසික) [U-AC3(II)] අදාළ වැටුප් පරිමාණයේ රු. 138,980/= (මාසික) මූලික පියවරෙහි පිහිටවනු ලැබේ. අධ්‍යයන දීමනාව වැටුපෙන් 116% + රු. 2,100 ක් ගෙවනු ලැබේ.

ඇ) කථිකාචාර්ය (තහවුරු නොකළ) - රු. 121, 340 - 5X 2,940 - 136,040 (මාසික) [U-AC3 (III)] අදාළ වැටුප් පරිමාණයේ රු. 121,340/= (මාසික) මූලික පියවරෙහි පිහිටුවනු ලැබේ. අධ්‍යයන දීමනාව වැටුපෙන් 102% + රු. 1,800 ක් ගෙවනු ලැබේ.

ඈ) කථිකාචාර්ය (පරිවාස) - රු. 94,400 - 10 X 2,400 - 118, 400 (මාසික) [U + AC 3 (IV)] අදාළ වැටුප් පරිමාණයේ රු. 94,400/= (මාසික) මූලික පියවරෙහි පිහිටුවනු ලැබේ. අධ්‍යයන දීමනාව වැටුපෙන් 91% + රු. 1,200 ක් ගෙවනු ලැබේ.

ඉ) පුස්තකාලයාධිපති තනතුර - රු. 198,280 - 13 X 4,850 - 261,330 (මාසික) [U-AC 5 (II)] අදාළ වැටුප් පරිමාණයේ රු. 198, 280/- (මාසික) මූලික පියවරෙහි පිහිටුවනු ලැබේ. අධ්‍යයන දීමනාව වැටුපෙන් 124% + රු. 13,300 ක් ගෙවනු ලැබේ.

ඊ) වැඩ ඉංජිනේරු (සිවිල්) තනතුර - රු. 85,305 - 3X 2,020 - 91,365 (EB) 93,765 - 14X2,400 - 122,565 (මාසිකව) [U-EX I(II)] අදාළ වැටුප් පරිමාණයේ රු 85,305/= (මාසික) මූලික පියවරෙහි පිහිටුවනු ලැබේ. වැටුපෙන් 36% - රු. 330 ක් MCA ලෙස ගෙවනු ලැබේ.

උ) ක්‍රම ලේඛක සහ පද්ධති විශ්ලේෂක, II ශ්‍රේණිය - රු. 85, 305 - 3 X 2,400 - 92,505 (EB) 94, 905 - 14 X 2,400 - 128, 505 (මාසික) [U-AS-2-(II)] අදාළ වැටුප් පරිමාණයේ රු. 85,305/= (මාසික) මූලික පියවරෙහි පිහිටුවනු ලැබේ. වැටුපෙන් 36% - රු. 330 ක් MCA ලෙස ගෙවනු ලැබේ.

ඌ) පරිගණක තාක්ෂණය පිළිබඳ උපදේශක II ශ්‍රේණිය - රු. 85,305 - 3 X 2,400 - 92,505 (EB) 94,905 - 14X 2,400 - 128,505 (මාසික) [U-AS 2(II)] අදාළ වැටුප් පරිමාණයේ රු. 85,305/= (මාසික) මූලික පියවරෙහි පිහිටුවනු ලැබේ. වැටුපෙන් 36% - රු. 330 ක් MCA ලෙස ගෙවනු ලැබේ.

- ➢ 2025.04.01 දිනැති කොමිෂන් චක්‍රලේඛ අංක 02/2025 ට අනුකූලව වැටුප් සහ අධ්‍යයන දීමනා හෝ මාසික අනිවාර්ය දීමනා ගෙවනු ලැබේ.
- ➢ ඉහත වැටුපට අතිරේකව, තෝරාගනු ලබන අයදුම්කරුට / අයදුම්කරුවන්ට ජීවන අංක දීමනාව සහ වෙනත් අනුමත දීමනා ගෙවනු ලැබේ.
- ➢ ඉහත සඳහන් අනුපාත රජයේ රෙගුලාසීන්ට අනුකූලව වෙනස් විය හැක.

## ප්‍රතිලාභ

- ➢ තෝරාගනු ලබන අයදුම්කරුවන් ඔවුන්ගේ මාසික වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට දයක වන අතර, විශ්වවිද්‍යාලය ඔවුන්ගේ වැටුපෙන් 15%ක දයකත්වයක් ලබා දෙන අතර එය 8%ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට සහ 7% විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට බැර කෙරේ. ඊට අමතරව ඔවුන් සේවක භාර අරමුදලට දයකත්වය දක්වන අතර, ඊට වැටුපෙන් 3% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලය විසින් ලබා දෙනු ඇත.
- ➢ 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීමේ පනතේ විධි විධානයන්ට අනුකූලව පාරිතෝෂිත ගෙවීම සිදු කෙරේ.
- ➢ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය හෝ ඉන් ඉහළ තනතුරු දරන්නන් සඳහා සම්පූර්ණ වැටුප් සහිත එක් අවුරුදු සප්ත වාර්ෂික නිවාඩු හෝ අවුරුදු දෙකක වැටුප් රහිත නිවාඩු සඳහා වසර 7ක සේවා කාලය අවසානයේ සුදුසුකම් ලබනු ඇත. මෙම සප්ත වාර්ෂික නිවාඩුව එතෙර ගතකරන විට ඒ සඳහා ගුවන්යානා ටිකට්පත් ගාස්තු ලැබීමේ හිමිකම අයදුම්කරුට මෙන්ම කලත්‍රයාට ද හිමි වේ.

## අයදුම් කිරීමේ ක්‍රමවේදය

නිර්දේශිත අයදුම්පත් සහ සුදුසුකම් ඇතුළුව වැඩිදුර තොරතුරු (කථිකාචාර්ය තනතුරු සඳහා 1997.11.21 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා (UGC) චක්‍රලේඛ අංක 721 හා එහි සංශෝධනයන් ප්‍රකාරව) , නියෝජ්‍ය ලේඛකාධිකාරී / අධ්‍යයන ආයතන අංශය (දුරකථන 0332215827, විද්යුත් තැපැල : drae@gwu.ac.lk) වෙතින් කාර්යාල වේලාව තුළදී ලබාගත හැක.

අයදුම්පත් මාර්ගගත ක්‍රමයට එවිය යුතුය. වැඩිදුර තොරතුරු සහ අත්පොත සමග අයදුම්පත් ආකෘති පත්‍ර 2025 දෙසැම්බර් 03 වන දින දක්වා විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය - https://gwu.ac.lk/. vacancies වෙතින් බාගත කළ හැක.

උඩුගත කරන ලද සහතිකපත්‍ර සහ ආකෘති පත්‍ර සමග මුල් අත්සන් සහ රබර් මුද්‍රාව සහිත බාගත කරගන්නා ලද අයදුම්පත් දෘඩ පිටපත්, බහා එවන කවරයෙහි ඉහළ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර අයදුම්පත් භාරගන්නා **අවසන් දින හෝ ඊට පෙර ලැබෙන පරිදි**, නියෝජ්‍ය ලේඛකාධිකාරී, අධ්‍යයන ආයතන අංශය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, වෙත එවිය යුතුය. අයදුම්පත සමග එවා ඇති සහතිකපත් පමණක් සම්මුඛ පරීක්ෂණයේදී සැලකිල්ලට ගැනේ. අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ සහ එවැනි අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ. අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ හෝ අයෝග්‍ය අයදුම්පත්, අදාළ ආකෘතියේ නොවන අයදුම්පත් (විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් බාගත නොකළ) හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී,**
**ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය,**
**ශ්‍රී ලංකාව.**
**දිනය : 2025 නොවැම්බර් 12.**